

# වඩා වැදගත්වන්නේ රටේ අනාගත සුරක්ෂිතභාවය මිස දේශපාලකයන්ගේ අවශ්‍යතා නොවේ

**ආචාර්ය දීපිකා උඩගම**

**නව ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවක් සම්මත කරගැනීමේ ක්‍රියාවලිය පිළිබඳ මතු කෙරෙන විවිධ විරෝධතා සහ ප්‍රශ්නගත කාරණා අතර ප්‍රමුඛ මාතෘකා කිහිපයක් සම්බන්ධයෙන් ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිසන් සභාවේ වත්මන් සභාපතිනිය, පේරාදෙණිය විශ්වවිද්‍යාලයේ නීති අධ්‍යයන අංශයේ හිටපු ආශාධිපතිනි ආචාර්ය දීපිකා උඩගම සමඟ කළ සාකච්ඡාවකි.**

**නව ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවක් සම්මත කරගැනීම සඳහා දැරෙන ප්‍රයත්නය නීති විරෝධී එකක් බවට වන නීති තර්කයක් ඇතැම් නීතිඥයන් විසින් මතු කරනු ලැබ තිබෙනවා. ඒ පිළිබඳ ඔබේ අදහස කුමක්ද?**

ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවක් අලුතෙන් සම්මත කරගන්න ජනවරමක් ලැබිලා තියනවාද ? ජනවරම ලැබී තිබෙන්නේ පවතින ව්‍යවස්ථාව සංශෝධනය කිරීම සඳහා පමණයි නේද? මැතිවරණ ප්‍රකාශනයේ නිශ්චිතවම දක්වා තිබෙන්නේ ජනමත විචාරණයකට තුඩු නොදෙන ආකාරයේ ව්‍යවස්ථා සංශෝධනවලට යන බව නොවේද ? මේ ආදී වශයෙන් මතු කරන කාරණා තාක්ෂණික කරුණුයි. මේ කාරණා ගැන අදහස් දැක්වීම්වලදී හුඟාක් වෙලාවට අපි මේක දිහා බලන්නේ ව්‍යුහාත්මක පැත්තෙන්. නීති තර්ක විතර්ක දාලා, තාක්ෂණික පරස්පරතා දාලා තමයි අපි මේවා විග්‍රහ කරන්න බලන්නේ. නමුත් රටක් හැටියට කොහොමද අපි ගොඩනැගෙන්නේ කියන එක අපි කල්පනා කරන්නේ නැහැ. ව්‍යවස්ථාව පිළිබඳ කාරණයේදී අපි ඒ ගැන මූලිකවම කල්පනා කළ යුතු වෙනවා. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවක් වැනි රටේ අනාගතයට අතිශයින් බලපාන විෂයක් පිළිබඳ කාරණාවලදී අපි බැලිය යුත්තේ රටක් වශයෙන් අපි ඉදිරියට යන්නේ කෙසේද කියන කාරණය මුල් කරගෙන මිස මෙවැනි තාක්ෂණික කාරණා මුල් කොට ගෙන නොවෙයි. ඇයි එවැනි ඉදිරි දැක්මක් අපිට නැත්තෙ? ඒක තමයි මට තියන ප්‍රශ්නය.

**නමුත් ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව කියන්නේ රටේ මූලික නීතිය. එය සකස්වන්නේත් නීති විරෝධී ආකාරයෙන් නම්?**

නව ව්‍යවස්ථාවක් සඳහා ජනවරමක් නැහැ කියන්නේ කොහොමද? මම ජනාධිපතිවරණයේදී මගේ ඡන්දය දුන්නේ නව ව්‍යවස්ථාවක් ගේන්න. ඊළඟට ඒ සඳහා පාර්ලිමේන්තුවේ තුනෙන් දෙකක බලයක් අවශ්‍ය වුණා. එය ලබාගැනීමට පාර්ලිමේන්තු මැතිවරණයක් පැවැත්වුණා. ඒකෙදි මම ඡන්දය දුන්නෙත් නව ව්‍යවස්ථාවක් ගේන්නයි. පසුගිය මැතිවරණවලදී ජනතාව ඡන්දය පාවිච්චි කළේ ඒ විදිහට. ඒ මැතිවරණ දෙකේදීම ජනවරමක් ඉල්ලුවේ රටේ නව ශිෂ්ඨසම්පන්න දේශපාලනයක් ගොඩනැගීමට. විධායක ජනාධිපති ක්‍රමය අහෝසි කිරීම ඇතුළුව ඊට අදාළ කාරණා රාශියක් එහිදී ඉදිරිපත් කෙරුණා. ඉතිං ඒකට තමයි ජනවරම ලැබුණේ. නව ව්‍යවස්ථාවක් සම්මත කිරීම කියන්නේ ඒ සඳහා වන එක් පියවරක්. එහෙම නැත්නම් අපි වගේ ඡන්දදායකයන් මොකටද ඡන්දය දුන්නේ ? 'මාර්තු 12 ව්‍යාපාරය' ජනාධිපතිවරණයේදී පොදු අපේක්ෂකයාට ඉදිරිපත් කළ යෝජනාවලදිත් මම කිව්වේ අපිට අලුත් ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවක් අවශ්‍යයි කියලා. පොදු අපේක්ෂකයා මාර්තු 12 ව්‍යාපාරයේ යෝජනා පිළිගත්තා. ඒ අනුව මාර්තු 12 ව්‍යපාරයත් ඒ මැතිවරණ ව්‍යාපාරය තුළ නියෝජනය වුණා.

**මීට පෙර 72 සහ 78 ව්‍යවස්ථා සම්මත කළේ ඊට පෙර මැතිවරණවලදී නව ව්‍යවස්ථාවක් සම්මත කරන බවට නිශ්චිතවම ප්‍රකාශ කොට ජනවරමක් ලබාගෙන බවයි ඇතැම් නීති විශාරදයන් කියන්නේ. මේකෙදි එහෙම නැති එකයි ප්‍රශ්නය**

නව ව්‍යවස්ථාවක් සම්මත කරගැනීමට ආණ්ඩුවට ජනවරමක් නැහැ කියා මතු කරන නීති තර්ක, තාක්ෂණික පරස්පරතා වගේම අනෙක් පැත්තෙන් නව ව්‍යවස්ථාවක් සම්මත කරගැනීමට ජනවරමක් ලැබී තිබෙනවා කියාත් නීති තර්ක මතු කෙරෙනවානේ. එහෙම නම් ඒ ගැන විනිශ්චයක් ගන්න වෙන්නේ දෙපැත්තේම කරුණු සළකා බලා ඒ මතයි. නමුත් මම කලින් කීවා වගේම මේ කාරණයේදී අපට වැදගත් වෙන්නේ ඒ විදියට තීන්දු තීරණ ගැනීම නොවෙයි. රටක් වශයෙන් පවතින අභියෝග ජයගෙන ඉදිරියට යා හැකිවන්නේ කොහොමද කියන කාරණය පුළුල්ව විමසා බලා තීරණ ගැනමයි. නව ව්‍යවස්ථාවකට ජනවරමක් නැහැ කියා කියනවා නම් සකස් කෙරෙන නව ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා කෙටුම්පත ජනමත විචාරණයක් සඳහා ඉදිරිපත් කිරීමෙන් එය පරීක්ෂා කිරීමටකට ලක්වෙනවානේ. ජනවරමක් තියනවාද නැත්ද අලුත් ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවක් මිනිස්සුන්ට ඕනේද නැත්ද කියන එක එතැනදි පැහැදිලිවම කියයි. මේක අපි කතා කරන්න ඕනේ මොනවගේ රටකද අපි ජීවත්වෙන්න කැමැති කියන අදහසට අනුව මිස නීති තර්ක මතම නොවෙයි. ඇත්තටම තාක්ෂණික කරුණු අනුව අපිට කෙස් පැළෙන තර්ක ඉදිරිපත් කරන්න පුළුවන්. ඔය තර්ක ඉදිරිපත් කරන්නේ දේශපාලන බලයට පොර වදින අය. නමුත් මේ ගැන තීරණය එන්න ඕනේ මේ රටේ සාමාන්‍ය ජීවිත ගතකරන්න කැමැති මිනිස්සුන්ගෙන්. දේශපාලන බලයට පොරබදන අයගෙන් නොවෙයි.



සාකච්ඡා කළේ
**ශ්‍රීලාල් සෙනෙවිරත්න**

**නව ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවක අවශ්‍යතාව ඔබ දකින්නේ කොයි ආකාරයටද?**

ශ්‍රී ලංකාවේ පශ්චාත් නිදහස් යුගය දිහා බැලුවාම නිදහසින් පසු ගෙවුණු අවුරුදු හැත්තෑවක දීර්ඝ කාල පරාශය තුළ දක්නට ලැබෙන්නේ වගවීමෙන් මුක්ත වුණු, ක්‍රම ක්‍රමයෙන් ප්‍රජාතන්ත්‍රවාදී ආයතන ක්‍රමය දුර්වල වුණු සමාජ ක්‍රමයක් කරා අප තල්ලුවී ගොස් ඇති බවක්. එක් අතකින් මේක ව්‍යුහාත්මක වශයෙන්ම දුර්වල වුණා. අපි බැලුවොත් ශ්‍රී ලංකාවේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සම්පාදනය දිහා, 1972න් පසු ජනරජ යුගයේදී ව්‍යවස්ථාව මගින්ම ප්‍රජාතන්ත්‍රවාදී ආයතන දුර්වල කළා. අනික් එක තමයි පරිචයෙනුත් දුර්වල වුණා. 72 ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවෙන් වුණේ පාර්ලිමේන්තුවේ බලය ඒකරාශි වීමක්. එතන සංවරණ සහ තුලන ක්‍රමය බොහොම දුර්වල වුණා. එතනදි අධිකරණ ක්‍රමයත් බොහොම දුර්වල වුණා. කලින් සෝල්බරි ව්‍යවස්ථාවේ තිබුණු ස්වාධීන අධිකරණ සේවා කොමිසන් සභා, ස්වාධීන රාජ්‍ය සේවා කොමිසන් සභා දේශපාලනීකරණයට අහුවෙලා දැඩි විදිහට දුර්වල වුණා. 78 ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව ඒ වන තෙක් පාර්ලිමේන්තුවේ ඒකරාශි කොට තිබුණු බලය විධායක ජනාධිපති ධුරයෙහි ඒකරාශි කළා. වගවීමකින් මුක්ත ජනාධිපතිවරයෙක් තමයි එතනදි නිර්මාණය වුණේ. එතනදිත් සංවරණ සහ තුලන ක්‍රමය බොහොම අඩුයි. එවැනි ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවක් යටතේ කටයුතු කරන්න ස්වාධීන ආයතනවලට බොහොම අපහසුයි. වගවීමෙන් මුක්ත වීමේ පරිචය ව්‍යවස්ථාවෙන් ඇති කළාට වඩා දහ ගුණයකින් ඒකෙන් වැඩිවුණා. සමාජයක් වශයෙන් අපේ හර පද්ධතිය කුමක්ද? ඇත්තවශයෙන්ම අපි බලාපොරොත්තු වෙන සමාජ හර පද්ධතිය කුමක්ද? කියන ප්‍රශ්නය මෙහිදී අතිශයින්ම වැදගත් වෙනවා. බොහෝ අවස්ථාවල අපි මේ පිළිබඳ තියන ප්‍රශ්න ගැන කතා කරන්නේ ව්‍යුහාත්මකව. ආයතනවල තියන දුර්වලතා, නීතිමය ක්‍රියා පටිපාටිවල තියන දුර්වලතා ඔය ආදී වශයෙන්. නමුත් මේක ඊට වැඩිය පුළුල්ව විග්‍රහ වුණේ නැත්නම් අපිට සාර්ථක ඉදිරි ගමනක් යන්න පුළුවන් වේ යැයි කියා මම හිතන්නේ නෑ.

ශ්‍රී ලංකාවේ වගවීමේ පරිචය දිහා බැලුවොතින් එහි තියන ප්‍රශ්නය වශයෙන් හඳුනාගන්න පුළුවන් වෙන්නේ